# ගී සඳළුව

Gee... Sandaluwa

සිසිර දිසානායක

# එක් වසන්තයක ආදරයක් !



වසර 2009 දෙසැම්බර් 19 රැයේ මෙල්බර්න් නුවර තවත් එක් නැවුම් කටයුත්තක් කෙරුණා. ඒ අප අතර සිටිනා යෞවන යෞවනියන් අතරින් ගායනයට දක්ෂයින්ගේත් දක්ෂතමයින් කිපදෙනා තේරූ අවසාන තරඟය උත්සවාකාරයෙන් පැවැත්වුණ ප්‍රසංගයයි. මේ තරඟ විනිශ්චය සඳහා මව් බිමේ සිට පැමිණි ප්‍රවීණ ගායන ශිල්පී ශිල්පිනියන් අතර එක් ප්‍රවීනතම ශිල්පියක සමඟ "සන්නස" "ගී සඳළුව" වෙනුවෙන් පිළිසඳරක යෙදෙන්නට අපට අවස්ථාව ලැබුණා. ඇය නිරෝෂා විරාජිනී ශිල්පිනියයි.

පෙර දින රැය පහන් වන තෙක්ම ඉහත කී ප්‍රසංගයට සහභාගී වෙමින් නිදි වරා සිටියද පසු දින උදය වරුවේ හුදෙකලාව විවේකීව සිටි ඇයගේ කාලයෙන් දෙහෝරාවක් පමණ අප හා සතුටු පිළිසඳරෙහි යෙදීමටත් "ගී සඳළුව" වෙනුවෙන් ගීතයක් පිළිබඳව අපව දැනුවත් කිරීමට වෙන් කිරීමත් වෙනුවෙන් මුලින්ම අප ඇයට ස්තූතිවන්ත වෙනවා.

"ඇත්තට ම මෑතකදී මම අළුතින් සී. ඩී. තැටියක් එළි දැක්වූයේ නෑ. ඒත් අන්තිමට එළිදක්-වපු ගීත එකතුවේ ඇතුලත් වුණ "එක වසන්තයක" කියන ගීතය විශේෂයක් වුණ නිසා ඒ ගැන කතා කරමු." නිරෝෂා ඇයගේ මියුරු ගායනීය හඬ අවදි කළා. මේ ගීය ඇතුලත්වන්නේ "තරු ඇස දහසක්" සංගීත තැටියයි: "මේ ගීතය විශේෂයක් වුණේ එකම පද රචනාව ගීත නිර්මාණ දෙකක් විදියට අද වෙනකොට හැමෝම අහන රචනාවක් බවට පත්වෙලා තියෙන නිසා" පද රචනයේ හිමිකරුවා කැළුම් ශ්‍රීමාල් නම් අප කවුරුත් දන්නා මාධ්‍යවේදියායි.

"මේ ගීතය මම තෝරාගෙන සුරේෂ් මාලියද්දේට දුන්නා සංගීත නිර්මාණය කරන්න. මට අවශ්‍ය ගී තනුව මොන වගේද කියලාත් මම පොඩි අදහසක් දීලා මේ රචනාව සුරේෂ්ට දුන්නෙ මගේ ප්‍රසංගයකට විදේශලත වෙන්න කලින්. විදේශ සංචාරයෙ-න් පස්සෙ ලංකාවට ඇවිල්ලා මම ගීතය අහපුවම මට හිතුනා මම හිතපු විදියෙම ගීතයක් නෙවෙයි කියලා. මට ඕන වුණේ සාමාන්‍ය සිංහල ගීතයක තියෙනවාට වඩා වෙනස් නාද රටා එකතු කරන්න. ඒ නිසා මම කල්පනා කලා මට ඕන විදියට ආයෙත් ගීතය වෙනස් කරගන්න. ඒ අනුව තමයි මම ගායනා කරන "එක වසන්තයක" ගීතය නිර්මාණය වුණේ.

නිරෝෂා උණුසුම් තේ කෝප්පයක් අපට පිළිගැන්වූවා.

"කලින් කරපු ගී තනුව කොහොමත් සුරේෂ් ගාව තිබුණා. මියුසික් ට්‍රැක් එක කරලයි තිබුණේ." පසුව හඬ කැවීම සඳහා මුලින් - සංගීතය වෙනම ම පටිගත කරගැනීමයි වර්තමානයේදී බොහෝවිට කෙරෙන්නේ. "කසුන් සුරේෂ්ලගෙ ගෙදර ආව වෙලාවක අහම්බෙන් ඔය ගීතය අහලා ඒ තනුවට ඒ ගීතය කියන්න කැමතියි; ඒත් නිරෝෂා මො-නවා කියයිද දන්නෙ නෑ කිව්වලු. ඉතින් සුරේෂ් කිව්වලු, නිරෝෂාගෙන් අහලා කියන්න කියලා." නිරෝෂා මේ සඳහන් කරන්නේ කසුන් කල්හාර යෞවනයේ ගායන හා නිර්මාණ ප්‍රවීණයා පිළිබඳවයි.

"පස්සෙ දවසක කසුන් දුරකථනයෙන් කතාකරලා ඇහුවා "මම මේ ගීතය කිව්වට කමක් නැද්ද ? කියලා" ඉතින් මම හිතුවා

**එක වසන්තයක - එක රාත්‍රියක**
**මට ඉබේ ම වාගේ ඔබෙ සුවඳ**
**එක හුස්මක්වත් ගන්නට**
**ඉඩ නැති තරමට දැනුණා විතරක් මතකයි**
**හද ලුහු බැඳ ඉවකරනා**
**පෙර සසරක සුපුරුදු සුවඳ**
**ඒ ඔබේ නොවෙ ද ?**
**එනමුදු ඒ ඔබම ද ?**
**ඔබම ද ඒ සබඳ ?**

**මේ වසන්තයේදී හමුවන සුළඟ සමඟ**
**සසැඳී පෑහෙන්නට හිතයි මට**
**ඔබෙ සුවඳ සමඟ මුසුවනු පිණිස**
**මගෙ සුසුම තියන්න ද**
**සිහිවනු පිණිස සබඳ ?**

**මේ වසන්තය ම ගත වී යන්නට පෙර**
**තුරුළේ ඇහිරෙන්න ට පතමි මම**
**ඔබෙ සිතැඟිවලට මුසුවනු පිණිස**
**මගෙ හැඟුමන් තියන්න ද**
**ගිවිසනු පිණිස සබඳ ?**

මේකත් පොඩි වෙනසක්නේ. මෙතෙක් කාලයකට එකම පද රචනය වෙනස් තනු දෙකක ශිල්පීන් දෙන්නෙක් ගායනා කරලා නෑ නේ. පිළිතුරු ගී ගායනා කරලා තියෙනවා. තනු දෙකක්. සංගීත රටා දෙකක්. පරස්පර විරෝධී නිර්මාණ දෙකක්. අපි දෙන්නම ගීත දෙක දෙන්නගෙ සී. ඩී. තැටිවලට ඇතුලත් කරගත්තා. කසුන් නම් දර්ශණගත කිරීමකුත් කරගත්තා." නිරෝෂා සිනාසුනා.

"මට ඕන කරලා තිබුණේ ජෑස් කියන සංගීත රටාවත් එක්ක එකෝස්ටික් සංගීත භාණ්ඩ යොදාගෙන මගේ කටහඬේ වෙනස් ආරයක ශෛලියක් එකතු කරගන්න. මං හිතන්නෙ ඒක සාර්ථක වුණා කියාලා. කසුන්ගේ ගීතයත් මිහිරියි. දැන් වෙනකොට රසිකයො ගීත දෙකම අහනවා. කාගෙද ඇත්තටම මේ ගීතය, කවුද කලින් කළේ කියන එක ඒ අයට ප්‍රහේළිකාවක්. ඉතින් ඒ ගැන ඒ අය නිතර අහනවා. ඇත්තටම අද වෙනකොට ඒ ගීත දෙකම අපේ ජනප්‍රිය ගීත වෙලා. ඒක ඉතින් විශේෂ දෙයක්."

"ඇත්තටම කසුනුයි මායි බොහොම සුහදවයි මේ නිර්මාණ හුවමාරු කරගත්තේ." තමන්ගේ රසිකයින් වෙනුවෙන් කළයුතු උපරිමය කිරීමයි කලාකරුවකුගේ යුතුකම. ඔවුන් වෙනුවෙන් කෙරෙනා කැප කිරීම්, බෙදා හදා ගැනීම් නිසාවෙන් ඔවුනට මතු නොව මතු පරපුරටද දායාද වන්නේ එකිනෙකට වෙනස් වූ අපූරු නිර්මාණයක්. හුදු මමත්වයෙන් එකිනෙකා කාකොටා වැටෙනා කලා ලෝකයක යෞවන ශිල්පී දෙපලකගේ අන්‍යෝන්‍ය අවබෝධයේ සහ සුහදත්වයේ සුන්දර අත්දැකීමකි මේ. ඒ ය යෞවනයේ මහිමය.

ඉක්බිතිව අප නිරෝෂාගේ සංගීත ලෝකයට එබිකම් කළා. "2009 දෙසැම්බර් 7 දා මම "ආදරය" කියලා මගේ අළුත් ප්‍රසංගයක් පටන් ගත්තා. කොළඹ බණ්ඩාරනායක අනුස්මරණන සම්මන්ත්‍රණ ශාලාවේ බොහොම ලස්සනට ප්‍රසංගය කෙරුණා. සාර්ථක ප්‍රතිචාරත් ලැබුණා. අද මේ වෙනකොට හුග දෙනෙක් විශේෂයෙන් කතාකරන ප්‍රසංගයක් බවට පත් වෙලා. මේ වකවානුවේ ශිල්පිනියක් මේ වගේ එක් පුද්ගල ප්‍රසංගයක් කරන්නෙ නෑ. ඒ නිසා නන්දා මාලිනී, ලතා වල්පොල වගේ ජ්‍යෙෂ්ඨ ගායිකාවන්ගෙන් පස්සෙ මම මේක පටන්ගන්න හිතුවා. මම හිතනවා දිගටම මේක කරගෙන යන්න පුළුවන් වේවි කියලා. මොකද මේ වෙනකොටත් පිටරටවල පවා සංදර්ශන පවත්වන්න කතා කරලා තියෙන නිසා."

"ඒ ඇරෙන්න අලුත් ගීත එකතුවක් කරන්න තවම හිතුවේ නෑ. අපේ රටේ තත්වය හොඳ අතට හැරුණොත් ලබන අවුරුද්ද දිහාවේ ඒ ගැන හිතනවා. එළිමහන් ප්‍රසංගත් අඩු නිසා මේ වගේ ප්‍රසංගවලට එන පිරිස වැඩියි. ඒ නිසයි අලුත් ගීත නිර්මාණ එකතුවකට වඩා "ආදරය" ප්‍රසංගය පටන් ගන්න හිතුවේ." නිරෝෂා විරාජිනියගේ "ආදරය" විඳින්නට කවදත් ඇයට ආදරය කරනා රසිකයින් ලබනා වරම මෙල්බර්න් නුවරුනට ද නුදුරකදී ලැබෙනු ඇතැයි අපගේ විශ්වාසයයි. "ගී සඳළුව" වෙනුවෙන් ස්තූතිවන්ත වෙමින් අප ඇයගෙන් සුමගත්තේ පෙර දා රැය නිදිවරා සිටි ඇයට තවදුරටත් විවේක ගන්නට ඉඩ ලබා දෙමින්.

අප නිරෝෂා ශිල්පිනිය හා සම්බන්ධීකරණය කළ "සමර් බ්‍රීස්" ප්‍රසංගයේ නිර්මාතෘ දිල්ශාන් ප්‍රනාන්දු හා සංවිධායකයින් වන විශ්ව වටිය ගේ සහ නිහාල් ප්‍රනාන්දු යන මහත්වරුන්ට අපගේ ස්තූතිය පිරිනමනවා.




යදියෙක්මි මම
යදින්නෙමි එකම එක
නිමේෂයක් මට
වැතිර ඉන්නට ඔබ දෙපා මුල
විඳින්නට සැනසුම් සුවය
සදාකාලික පරම පිවිතුරු
නවත්වා ජීවිතය
කල්තබා සියළු දේ
මා දෝත පුරාගත්

ඉතින් නෑ මට
සැනසුමක්
සිසිලක්
එක නිසල
මොහොතක්
ඔබේ දසුනෙන් වියෝවූ සඳ
තෙරක් නැති සයුරක් තරන්නෙමි
නිමක් නැති දුක් සයුරකි දිවිය

මගේ හදවත් කවුළුවෙන්
වසන්තය එබිකම් කරයි අද
මුමුණමින් ගී ස්වර කවි පද
සුපිපි මල් ගොමු යහන් මත
පෙම් කෙලින බිඟුන්ගේ
සප්ත සර හරූ ඇසෙයි
රෑ

කාලයයි මට
රැඳවෙන්න භාවනාවක
ඔබේ වත දෙස නෙත් යොමා
පිරී ඉතිරෙන නිසලතාවයෙන් සුපිපී
ගයන්නට මගේ
නිහරූ ආදර ගීය

පිදෙන්නට ඉපිලෙනා
මගේ හදවත් පියුම
පුදන්නට මට
ඔබ දෙපාමුල
තැනූ ආදර පුදසුනේ

I ask for a moment's indulgence to sit by thy side. The works that I have in hand I will finish afterwards.

Away from the sight of thy face my heart knows no rest nor respite, and my work becomes an endless toil in a shoreless sea of toil.

Today the summer has come at my window with its sighs and murmurs; and the bees are plying their minstrelsy at the court of the flowering grove.

Now it is time to sit quite, face to face with thee, and to sing dedication of live in this silent and overflowing leisure.

*රබින්ද්‍රනාත් තාගෝර්යන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු